Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව**

සතිය- 2021 -06-07- 2021-06-11

විෂය - **නර්තනය**

ශ්‍රේණිය 13

**Prepared by-H.I.NeelaKanthi.**

නිපුණතාව-08 - නර්තන කලාව හා අනෙකුත් සෞන්දර්ය කලාවන් අතරඇති සහ සම්බන්ධතාව අධ්‍යයනය කරමින් තොරතුරු ඉදිරිපත් කරයි.

නිපුණතා මට්ටම 8. 1 නර්තන කලාව හා සබැදි අනුශාංගික අංග පිළිබඳ තොරතුරු විමසුමට ලක් කරයි.

**නිවැරිදි පිළිතුර තෝරන්න.**

1.කලාත්මක හා සංකීර්ණ බවකින් යුත් රංග භාණ්ඩ භාවිතා කරන නර්තන සම්ප්‍රදාය වන්නේ

1. උඩරට නර්තන සම්ප්‍රදාය 2. පහතරට නර්තන සම්ප්‍රදාය 3. සබරගමු නර්තන සම්ප්‍රදාය 4.සම්ප්‍රදායන් තුනෙහිම

2. රටයකුම ශාන්තිකර්මයේ දොළහ පෙළපාළියට අයත් රංග භාණ්ඩ ගණන

10 කි 2.18 කි 3. 12 කි 4. 15 කි

3.මුල් කාලයේ දී ආලෝකය සදහාද ශාන්තිකර්ම ශිල්පීන් ------------ අතට ගන්නා ලදි .

1.විලක්කු 2. දෙකොන විලක්කු 3.පන්දම් 4.කොප්පරා පහන්

4.සන්නියකුම යාගයේදී ----------- යකාගේ නළු ශරීරයටම රංග උපකරණ සැරසිළි යොදා ඇත .

1 රීරි 2. මහසොහොන් 3.කෝල 4.කළු යකා

5.අස්නය නර්තනයේ දී රංග භාණ්ඩ ලෙස යොදා ගනී.

1. පන්දම සහ ඊ ගස 2. පොල් පන්දම සහ විලක්කු 3.පොල් පන්දම සහ ඊ ගස 4.ඊ ගස සහ විලක්කු

**හිස්තැන් සදහා නිවැරදි පිළිතුරු යොදන්න.**

6. රටයකුම ශාන්ති කර්මයේ කපුයක්කාරියේදී ---------- ------------ ----------- යන රංග භාණ්ඩ යොදා ගනී.

7.----------------- රැගෙන කොහොඹා කංකාරි ශාන්ති කර්යේදී අස්නය නර්තනය ඉදිරියෙන් ගමන් ගනී.

8.------------ -------------- යන අමුද්‍රව්‍යයන් ශාන්තිකර්ම රංග භාණ්ඩ නිර්මාණය කිරීම සදහා යොදා ගනී.

9.නව කොළ අත්ත එක් අතකටත් අනෙක් අතට අත් පන්දමත් ------------ සමයමේදී රංග භාණ්ඩ ලෙස ගනු ලබයි .

10.කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ --------------- නර්තන අංගයේදී රංග උපකරණයක් ලෙස දුන්න අතට ගනු ලබයි .

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න .**

11.ශාන්තිකර්ම වල භාවිත රංග උපකරණ වෙන වෙනම නම් කරන්න.

12.රංග උපකරණ සකස් කිරීම සදහා යොදා ගන්නා අමුද්‍රව්‍යයන් හා උපකරණ නම් කරන්න .

13. අනෙකුත් ශාන්තිකර්ම වලට වඩා පහතරට නර්තන සම්ප්‍රදායේ රංග භාණ්ඩ කලාත්මක හා සංකීර්න බවකින් යුක්තය . මෙම කියමන පැහැදිළි කරන්න .

14. අද්‍යතන පසුබිම් සැලසුම්කරණය හා රංග උපකරණ නිර්මාණ සදහා ශාන්තිකර්ම ක්ෂේත්‍රයෙන් ලත් ආභාසය මනා පිටුවහලකි . ඔබේ අදහස් ඉදිරිපත් කරන්න .